# ශ්‍රී ලංකා මහාද්වීපික තටාකයේ බාහිර සීමාව නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය - 2012

**1. මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම් හේතුවෙන් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදිකර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මූල්‍ය කාර්ය සාධනය**

-----------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.4,336,157 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.771,055,934 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තර | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| පරිගණක සහ මුද්‍රක (ප්‍රින්ටර්) | - | - | 6,853,776 |
| ලී බඩු සහ සවිකිරීම් | - | - | 826,913 |
| වෙනත් උපකරණ | - | - | 1,940,045 |
| උපදේශන සේවා, අත්කර ගැනීම් හා භූකම්පන දත්ත | - | - | 691,623,036 |
| පුනරාවර්තන වියදම | 4,336,157 | 5,430,937 | 69,252,603 |
| ජාතික සාගර සම්බන්ධතා කමිටුව | - | - | 559,561 |
| එකතුව | 4,336,157 | 5,430,937 | 771,055,934 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 උපයන විට ගෙවීම් බදු

දේශීය ආදායම් පනතේ උපයන විට ගෙවීම් බදු මාර්ගෝපදේශවලට අනුව, ද්විතියික සේවා නියුක්තිය මත මුළු ආදායම රු. 25,000 ඉක්මවයි නම්, සියයට 16 ක උපයන විට ගෙවීම් බදු ප්‍රතිශතයක් අදාළ වේ. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ නිලධාරීන් දෙදෙනෙකුගේ උපයන විට ගෙවීම් බදු වැටුපෙන් සියයට 10 ක ප්‍රතිශතයකට අඩු කර තිබුණි.

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන 2012 වර්ෂයේ ප්‍රසම්පාදනය කරන ලද වටිනාකම රු.559,560 ක් වූ වත්කම්, ගෙවීම් වවුචර් හා අදාළ උපයෝගී ලිපිලේඛන නොමැති වීමෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) ව්‍යාපෘතියට අයත් සියලු ස්ථාවර වත්කම් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයට හා ජාතික සාගර කටයුතු පිලිබඳ කමිටුවට භාර

දී තිබුණි. නාරා සහ නොඇක් ආයතනවලින් ලැබුණු ලැබීම් නියෝග නොමැති වීමෙන් එම ආයතනවලට වත්කම් භාරදුන් බවට තහවුරු කර ගත නොහැකි විය.

**3.3 අරමුණු ලඟා කර ගැනීමෙන් පසු දරන ලද මෙහෙයුම් වියදම්**

මහාද්වීපික තටක සීමා ඉල්ලුම් කිරීම සඳහා එකසත් ජාතීන්ගේ කොමිෂන් සභාව වෙත වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා 2003 වර්ෂයේදී ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණද, එම වාර්තාව 2009 මැයි මස ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමෙන් පසුවත් ඒකාබද්ධ අරමුදලින් රු.14,637,222 ක් උපයෝජනය කර ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් 31 දක්වා දිගටම පවත්වා ගෙන ගොස් තිබුණි.

**4. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

4.1 ව්‍යාපෘතිය අවසන් වූ දිනය වන 2012 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 771.05 ක පිරිවැයක් දරා තිබුණි. අරමුදල් සැපයීම හා එහි උපයෝජනය පිළබඳ සාරාංශයක් පහත දැක්වේ.

| අරමුදල් සැපයීම | සැපයූ අරමුදල් | | 2012 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | | අවසන් දිනය වූ 2012 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිලිබඳ සමුච්චිත තත්ත්වය |
|---|---|---|---|---|---|
| | එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන |
| ශ්‍රී.ලං.ර. | - | 85.00 | 4.89 | - | 79.43 |
| නෝර්වේ | 2.0 | 185.50 | - | - | 691.62 (නෝර්වේ සහ නෝර්වේ මිශ්‍ර ණය) |
| නෝර්වේ මිශ්‍ර ණය | 5.2 | 463.76 | - | - | |
| | 7.2 | 734.26 | 4.89 | | 771.05 |

**4.2 නෝරාඩ් ප්‍රදාන හා ණය උපයෝජනය**

2012 දෙසැම්බර් 31 දිනට නෝරාඩ් ප්‍රදාන හා ණය සහ එහි උපයෝජනයේ සාරාංශය පහත දැක්වේ.

| | සැපයූ ණය / ප්‍රදාන | | අවසන් දින වූ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය | |
|---|---|---|---|---|
| | එ.ජ. ඩොලර් මිලියන | එන්ඕකෝ මිලියන | එ.ජ. ඩොලර් මිලියන | එන්ඕකෝ මිලියන |
| ප්‍රදාන (උපදේශක සේවා) | 2.0 | 14.20 | 0.94 | 6.70 |
| නෝර්වීජියානු මිශ්‍ර ණය (අත්පත් කර ගැනීම් සහ භූකම්පන දත්ත) | 5.2 | 36.92 | 5.20 | 36.92 |
| | 7.2 | 51.12 | 6.14 | 43.62 |

ඉහත සඳහන් ණය හා ප්‍රදාන 2008 දක්වා පමණක් ලැබී තිබුණි. ව්‍යාපෘතිය මගින් 2012 දෙසැම්බර් 31 දක්වා ණය ප්‍රමාණය වූ එ.ජ. ඩොලර් මිලියන 5.2 සම්පූර්ණයෙන් උපයෝජනය කර තිබුණද, ප්‍රදානවලින් උපයෝජනය කර තිබුණේ එ.ජ. ඩොලර් මිලියන 0.94 ක් එනම් සියයට 47 ක ප්‍රතිශතයකට සමාන මුදලක් පමණකි.